# ඇසළ පොහෝ දා තුන් ලොව වටා කරකැවුණු ධර්ම චක්‍රය

ශාස්ත්‍රපති සාමවිනිසුරු
ඊ.එෆ්. විතානගේ
ශ්‍රී ලංකාවේ සිට බණ්ඩාරගම අලුබෝමුල්ල

වර්ෂ දෙදහස් හයසියයකට පෙර වෙසක් පුර පසළොස්වක් පොහොය දිනක දඹදිව බුද්ධගයා ශුද්ධ භූමියේදී දස මරුන් පරදවා සම්මා සම්බුද්ධත්වයට පත් සිදුහත් මහ බෝසතාණන් වහන්සේ සත්සති ගෙවා තමන් අවබෝධ කරගත් ධර්මය ප්‍රථමයෙන් දේශනා කරන්නේ කාටද කියා මෙනෙහි කළ සේක. එහිදී උන්වහන්සේට සිහිපත් වූයේ තමන්ට දුෂ්කර ක්‍රියා සමයේදී හමු වූ භාර්ගව ආලාරකාලම උද්දක රාමපුත්ත යන පඤ්චාභිඥ අෂ්ට සමාපත්තිලාභී ඉසිවරුන්ය. එහෙත් ඒ වනවිට ළඟ ළඟම ඒ ඉසිවරු අපවත් වී සිටියහ. ඊටපසු සිය අවුරුදු දුෂ්කර ක්‍රියා සමයේදී ඇප උපස්ථාන කළ කොණ්ඩඤ්ඤ වප්ප භද්දිය මහානාම අස්සප යන පස්වග තවුසන් ගැන සිහිපත් වූහ.

එකල පස්වග තවුසන් බරණැස් නුවර ඉසිපතනාරමයේ වැඩ සිටින බව දැනගත් බුදුන් වහන්සේ මිගදාය බලා වැඩම කළ සේක. අතරමග දී උපක ආජීවකයාද මුණ ගැසුණු විට ඔහු සමඟ ද පිළිසඳර කතා බැසගත් සිද්ධාර්ථ තාපසයාණෝ අප කරා එන බව පෙනේ යයි කතාබස් කරමින් කලින් අප සමග සුහදව සිටි කෙනෙකු නිසා හිඳ ගන්නට පමණක් සුදුසු අසුනක් පිළියෙළ කරමු යයි කතිකා කර ගත්හ.

එහෙත් බුදුන් වහන්සේ ළඟ ළඟම වඩින විට එසේ සිටිය නොහැකිව ඉදිරියට ගොස් පා සිවුරු පිළි අරගෙන පා සෝදා වැඳ නමස්කාර කර වාඩි වෙන්නට සලස්වා ආ ගිය තොරතුරු කතා බස් කළහ.

පස්වග තවුසන් පරණ පුරුදු විදියට තමන් හා සමානයයි සිතා ආවුසෝ වාදයෙන් කතා බස් කළ නිසා දැන් තමන් වහන්සේට එසේ ආමන්ත්‍රණය නොකළයුතු යයි වදාළ සේක. ඔවුහු එය පිළි නොගත් නිසා දෙවන තුන්වන වරටත් එය සුදුසු නැතිබව වදාළහ.

එවිට බුදුන් වහන්සේ තමන් මීට කලින් මා බුදු කෙනෙකු යයි ප්‍රකාශ කර තිබේදැයි ප්‍රශ්න කළහ. නැත කවදාවත්ම නැත ස්වාමීනී යි පිළිතුරු දුන්හ.

එකල සමාජයේ දැඩි ලෙස පිළිගත් මතය වූයේ දුෂ්කර ක්‍රියා කරලම මෝක්ෂයක් එක්තරා විමුක්තියක් ලබා ගත් බව කියයි. පස්වග තවුසෝ ද ඒ මතයේ තදින් එල්බගෙන සිටියහ.

සිදුහත් කුමරා ඒකාන්තයෙන්ම බුදුවනවා යයි පෙර කවදාවත් නො ඇසූ විරූ ධර්මයක් බව බුදුන් වහන්සේ වැඩි දුරටත් විස්තර කළහ. චක්ඛුං උදපාදි ඤාණං උදපාදි විජ්ජා උදපාදි පඤ්ඤා උදපාදී ආලෝකෝ උදපාදි නුවණැස පහළ විය ඤාණය පහල විය. විද්‍යාව පහළ



කොට එහෙනම් ඔබවහන්සේ 'අනන්ත ජින' යයි පවසා උපක ආජීවකයා බුදුන් වහන්සේගෙන් සමුගෙන යන්නට ගියේය.

දුරදීම සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේ වඩින බව දුටු පස්වග තවුසන් අපෙන් ඇප උපස්ථාන ලබමින් සය අවුරුද්දක් දුෂ්කර ක්‍රියා කොට විමුක්තියක් ලබන්නට බැරිව නැවතත් කාම සුඛල්ලිකානුයෝගයට විමුක්තියක් ලබාගත යුතු බවය පූර්ණ කස්සප මක්කලී ගෝසාල අජිත කේෂ කම්බල - පකුද කච්චායන සඤ්ජය බෙල්ලට්ඨ පුත්ත - නිඝණ්ඨ නාථ පුත්ත යන ෂඩ් ශාස්තෘන් වහන්සේලාගේ සහ අනිකුත් දෙසැටක් මිත්‍යා දෘෂ්ටීන්ගේ මතය වූයේ එයයි.

නිඝණ්ඨ නාථ පුත්ත දොළොස් අවුරුද්දක්ම දුෂ්කර ක්‍රියා කොට කෛවල්‍ය පදවිය නම් වූ නම් තබන අවස්ථාවේදී පැමිණි බමුණන් එකසිය අටදෙනාගෙන් කොණ්ඩඤ්ඤ බ්‍රාහ්මණයා පමණක් එසේ කියා තිබුණු බව මතකය. එහෙත් පසු කලෙක ඔහුද යට කී මතයේ තදින් එල්බ ගත්තේය.

බුදුවීම ගැන සැක පහළ කෙළේය. පසුව කොණ්ඩඤ්ඤ තවුසාට කරුණු පැහැදිලි කර දී ධම්මචක්කපවත්තන සූත්‍රනේ ධර්ම දේශනා කළ සේක. පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු, විය. ප්‍රඥාව පහළ විය. ආලෝකය පහළ විය යනාදී වශයෙන් චතුරාර්ය සත්‍යය ආර්ය අෂ්ටාංගික මාර්ගය සම්මා ඤාණ - සම්මා විමුක්ති තිපරිවට්ට ද්වාදසාකාර සීල විසුද්ධි චිත්ත විසුද්ධි - දිට්ඨි විසුද්ධි සංඛා විතරණ විසුද්ධි - ඤාණ දස්සතු විසුද්ධි යනාදී විවිධ

38 වන පිටට




